ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL' S DEPARTMENT

ෆැක්ස් / தொலைநகல் / Fax } 2684051

අංක.07, ග්‍රෙගරි මාවත, කොළඹ 07.
இல 7, கிரகறிஸ் மாவத்தை கொழும்பு 07
No 07 Gregory's Avenue Colombo 07

ඊමේල් / ஈ-மெயில் / E.mail } Landcom@sltnet.lk

චක්‍රලේඛ අංක 2006/3

මගේ අංකය / எனது இல / MY NO } 4/1/විවිධ/සුනාමි දීමනාපත්‍ර
ඔබේ අංකය / உமது இல / YOUR NO }

දිනය / திகதி / DATE } 2006.09.13

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන් නැවත පදිංචි කරවූ රජයේ ඉඩම් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍ර ලබාදීම.</u>**

1. "සුනාමියෙන හානිවූ නිවාස නැවත ඉදිකිරීම හා ඉඩම් වලට දීමනා පත්‍ර ලබාදීම" මැයින් ඔබ ඇමතූ මගේ 4/1/විවිධ/සුනාමි දීමනා පත්‍ර හා 2006.02.28ව, 2006.08.09 ලිපි වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. සුනාමියෙන් හානිවූ නිවාස නැවත ඉදිකිරීම සඳහා වූ ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ආයතනය (RADA) සහ මෙම කටයුතුත පිළිබඳව මෙතෙක් ක්‍රියාකල ආයතනවල ඉල්ලීම් සැලකිල්ලට ගෙන ඉහත ලිපි වලින් දෙන ලද උපදෙස් මෙයින් සංශෝධනය කරමි.

3. සුනාමි ව්‍යසනය නිසා විපතට පත් පවුල් නැවත පදිංචිකර ඇති රජයේ ඉඩම් වල අයිතිය ඔවුනට ලබාදීම සඳහා පහත සඳහන් පියවර ගත යුතුව ඇත.
   i. අදාල පවුල් පදිංචි කර ඇත්තේ රජයේ නව ඉඩමක නම්, ඔවුනට රජයේ ඉඩම් ආඥා පනත යටතේ එක්වරම දීමනා පත්‍රයක් ලබාදීම.
   ii. අදාල පවුල් පදිංචිව සිටින්නේ ඔවුනට කලින් බලපත්‍රයක් මත හෝ දීමනා පත්‍රයක් මත ලබාදුන් ඉඩමක නම්:
      (අ). එම ඉඩමේ බලපත්‍රය/දීමනාපත්‍රය අස්ථානගතව ඇත්නම් එවායේ පිටපත් නොමිලේ ලබාදීම.
      (ආ). එසේ පිටපත් ගොනු ගත නොහැකි බලපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම.
   iii. රජයේ ඉඩම් වල ඉදිකර තිබූ නිවාස වල පදිංචිකරවූ පවුල්වලට එවායේ අයිතිය ලබාදීම.

මෙම කරුණු අතරින පළමුව නව ඉඩම්වල පදිංචිකල ජනතාව සම්බන්ධව පහත පියවර ගතයුතුව ඇත. මෙම වැඩපිළිවෙළ සම්බන්ධව කලින් විවිධ චක්‍රලේඛ හා උපදෙස් විවිධ ආයතන වලින් ඔබ වෙත සපයා ඇතත දීමනාපත්‍ර පිළියෙල කිරීම නීතිමය කාර්යක් බැවින් මෙම උපදෙස් අනුව ක්‍රියා කිරීම අවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.



| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය / பொது / General | 2677160 | ආයතන / நிர்வாக / Establishment | 2571173 | ගිණුම් / கணக்கு / Accounts | 2675574 | ඉඩම් / காணி / land | 2675576 2675372 | සංවර්ධන / அபிவிருத்தி / Development | 2677293 |

4. <u>සුනාමි ව්‍යසනයෙන් අවතැන්ව රජයේ නව ඉඩම්වල පදිංචි කරවූ පවුල්වලට දීමනාපත්‍ර ලබාදීම.</u>

දැනට ගෙන ඇති තීරණ අනුව අවතැන්වූ ජනතාව නැවත පදිංචි කල රජයේ නව ඉඩම් සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීමට ක්‍රියා කල යුතුය. මෙම කටයුත්ත ඉතා පරිස්සමෙන් සිදුකල යුතු කටයුත්තක් බැවින් කෙණු කාරක මණ්ඩලයේ සහායෝගය ලබා ගෙන එක් එක් ඉඩම් කොටස සම්බන්ධව මේ සමග එවා ඇති ඉ.කො./සු.දී.ප/1 දරණ ආකෘතියෙන් එක් එක් පුද්ගලයා පිළිබඳව තොරතුරු පිටපත් තුනකින් රැස්කිරීමට කටයුතු කරන්න. මෙම ආකෘතියේ පළමු කොටස අදාල ඉඩම පිහිටි කොට්ඨාශයේ භාර ග්‍රාම නිලධාරී හෝ සංවර්ධන උපදේශක විසින්ද, II කොටස ජනපද නිලධාරී / ඉඩම් නිලධාරී මගින්ද පරීක්ෂා කොට නිර්දේශයක් ලබා ගැනීමෙන් පසු, අදාල පවුල් ඒකකයට ලබාදී ඇති ඉඩම් කොටස සඳහා දීමනා පත්‍රයක් ලබාදීම සඳහා ඔබගේ නිර්දේශය iii කොටස යටතේ පුද්ගලිකව ලබාදීම අවශ්‍යය. වැරදි පුද්ගලයෙකු වෙත දීමනා පත්‍රයක් පිළියෙල කිරීමෙන් පසු එය අවලංගු කිරීම ඉතා අපහසු කාර්යයක් බැවින් අවතැන්වූ පුද්ගලයින් නිවැරදිව තෝරා ගැනීමේ පූර්ණ වගකීම ඔබට පැවරෙන අතර, එය සම්පූර්ණ විනිවිද භාවයකින් සිදු කිරීම අත්‍යවශ්‍යය.

මෙසේ සියලුම ඉඩම් ලාභීන් වෙනුවෙන ඉ.කො./සු.දී.ප/1 ආකෘතිය සම්පූර්ණ කල පසු ඒ අනුසාරයෙන් ඉ.කො./සු.දී.ප/2 ලේඛණය පිළියෙල කර, එය සති දෙකක කාලයක් කොට්ඨාශය තුල මහජන විරෝධතා සඳහා ප්‍රසිද්ධ කර තැබීමට ක්‍රියාකල යුතුය. එවැනි විරෝධතා ලිඛිතව හෝ වාචිකව ලැබේ නම් එවා පිළිබඳව පරීක්ෂා කොට නිවැරදි අවසාන ඉ.කො./සු.දී.ප/2 ලේඛණ පිටපත් තුනකින් සකස්කර ඉ.කො./සු.දී.ප/1 ආකෘති වල පිටපත් 2 බැගින්ද අදාල දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම්වරුන් එම ලේඛණ පරීක්ෂා කොට, තමන්ගේ නිර්දේශය සමග ඉ.කො./සු.දී.ප/2 පිටපත් දෙකක් හා ඉ.කො./සු.දී.ප/1 පිටපත් දෙක බැගින්ද අදාල පලාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස් වෙත එවීමට ක්‍රියාකරනු ඇත. පළාත් ඉඩම් කොමසාරිස් විසින් එම ලේඛණ පරීක්ෂා කොට ඉ.කො./සු.දී.ප/1 පිටපතක් බැගින්ද සමග ඉ.කො./සු.දී.ප/2 ආකෘතියේ පිටපතක් ඔහුගේ නිර්දේශ සමග මා වෙත එවනු ඇත. ඉන්පසු එම තොරතුරු පදනම් කරගෙන දීමනාපත්‍ර සකස් කිරීම මවිසින් කරනු ලැබේ.

5. <u>බලපත්‍ර හෝ දීමනාපත්‍ර මත ලැබූ ඉඩම් වල පදිංචිව සිට නැවතත් එම ඉඩම් වල පදිංචිවූ, මුල් බලපත්‍ර / දීමනාපත්‍ර ලාභීන්ගේ අස්ථානගතවූ බලපත්‍ර / දීමනාපත්‍ර වල පිටපත් ලබාදීම.</u>

සුනාමි ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ආයතනය (RADA) විසින් දැනට රැස්කර ගෙන ඇති තොරතුරු අනුව කලින් බලපත්‍රයක් මත හෝ දීමනා පත්‍රයක් මත බැහැරකල රජයේ ඉඩමක පදිංචිව සිට සුනාමි ව්‍යසනය නිසා අවතැන්ව නැවතත් එම ඉඩම් වල පදිංචි කරවූ බලපත්‍ර හෝ දීමනා පත්‍ර හිමිව සිටි ජනතාවට ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු පැනනැගී ඇත. එවැනි ඉල්ලීම් පිළිබඳව පහත පරිදි ක්‍රියා කරන්න.

අ.) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර මත තිබූ ඉඩම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් බලපත්‍ර සුරක්ෂිතව ඇත්නම් එයින් පායා පිටපතක් සහතික කර බලපත්‍රකරු / උරුමකරු වෙත නොමිලේ ලබා දෙන්න. බලපත්‍ර පිටපත් විනාශවී හෝ අස්ථානගතවී ඇතත ඉඩම් ලෙජර සුරක්ෂිතව ඇතනම් ඒ අනුසාරයෙන් බලපත්‍ර පිටපත් දෙකකින් සකස් කොට එක පිටපතක් කාර්යාලයේ ගොනු කරගෙන, අනෙක් පිටපත ඉඩම් ලාභියාට නොමිලේ නිකුත් කරන්න. මෙහිදී ලෙජරය ආශ්‍රයෙන බලපත්‍ර පිටපත සකස කල බවට බලපත්‍රයේ සටහන් කල යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබූ සියලුම ලෙජර හා බලපත්‍ර ද, සුනාමි ව්‍යසනය නිසා විනාශ වී ඇත්නම් අදාල මුල හිමිකරුවන්ගේ තොරතුරු අනවසර නිත්‍යානුකූල කිරීම සඳහා හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයකින ලබාගෙන, අදාල පරිදි පළාත් ඉඩම් කොමසාරිස්ගේ හෝ මගේ විශේෂ අනුමැතියක් ගෙන නව බලපත්‍රයක ලබාදීමට ක්‍රියා කරන්න. මෙහිදී මායිම් හෝ අයිතිය පිළිබඳව ගැටළුවක

ඇත්නම් එවාට අවශ්‍ය විසඳුම් ලබා දෙමින් අදාළ වාර්තාව නිර්දේශ කර අදාළ වන පරිදි පළාත් ඉඩම් කොමසාරිස් වෙත හෝ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් මඟින් මා වෙත එවිය යුතුය. (අදාළ අනවසර ආකෘති පත්‍රයක් මේ සමග අමුණා ඇත.) මෙසේ කටයුතු කළයුතු ඉඩම් කැබලි විශාල ප්‍රමාණයක් ඇති අවස්ථාවක තෝරා ගැනීම් පිළිබඳව ජනතාව දැනුවත් වීම සඳහා විරෝධතා ලැයිස්තුවක් ප්‍රසිද්ධ කොට විරෝධතා තිබේද යන්න සලකා බැලීම වඩාත් සුදුසුය. එසේ විරෝධතා ප්‍රසිද්ධ කළ බවද, එම ලේඛනයද ඉහත පරිදි ඉදිරිපත් කළ යුතුය.

ආ.) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් මත තිබූ ඉඩම්

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කළ වලංගු දීමනා පත්‍රයක් මත ඉඩමක පදිංචිව සිට පැවතත් එම ඉඩමේම පදිංචි කළ දීමනා පත්‍ර කරුවෙකුගේ දීමනා පත්‍රය විනාශවී ඇත්නම් එහි පිටපතක් නොමිලයේ ලබා දීමට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව කටයුතු යොදනු ඇත. එසේම එම දීමනා පත්‍රයට රේඛා චිත්‍රයක් තිබුනේ නම් එය නොමිලයේ ලබාදීමට මැනුම් දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ඇත. මෙවැනි ඉල්ලීම් කොපමණ සංඛ්‍යාවක් තිබේද යන්න ගැන ඔබ විසින් ඒ ඒ කොට්ඨාශ වල ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් තොරතුරු ලබා ගෙන එම අවශ්‍යතා පිළිබඳ ලේඛණ සකස් කර අදාල කොට්ඨාශයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත හා මැනුම් අධිකාරීවරුන් වෙත එම ඉල්ලීම් ඉදිරිපත් කල යුතුය. කරුණාකර මෙම පහසුකම් පිළිබඳව අදාල ජනතාව දැනුවත් කරන්නේ නම් මැනවි.

ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත යටතේ නිකුත් කල තීරාදන සාධන පත්‍රයන් සම්බන්ධයෙන්ද ඉහත පරිදිම ක්‍රියාකල යුතුය. මහජනතාවගෙන් ඉහත 5 ඡේදයේ (අ) හා (ආ) යටතේ ලැබෙන ඉල්ලීම් දිවුරුම් ප්‍රකාශන ස්වරූපයෙන ලබා ගැනීම අවශ්‍යය.

6. <u>රජයේ ඉඩම් වල ඉදිකල තට්ටු නිවාස වල පදිංචිකල අවතැන්වූවන් සඳහා දීමනාපත්‍ර ලබාදීම.</u>

රජයේ ඉඩම් වල දැනට ඉදිකර ඇති මහල් නිවාස වල පදිංචිකරුවන්ට "සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" (Condomonium Management Authority) මඟින් ඔප්පු ලබාදීම සිදුකරනු ඇත. එම ඉඩම් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාකරනු ඇත. එම ඔප්පු නිකුත් කිරීමේ වැඩපිළිවෙල එම ආයතන විසින් ඉදිරියේදී ඉදිරිපත් කරනු ඇත.

7. <u>දීමනාපත්‍ර පිළියෙල කිරීම කඩිනම් කිරීම සඳහා දීමනා ගෙවීම.</u>

මෙම කටයුත්ත නිමකිරීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ඉතා කඩිනමින් ගතයුතු නිසා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩල වලට මෙන්ම කාර්යාල වල කාර්යය මණ්ඩලයටද සිය කාර්යාල වේලාවෙන් බැහැරව කටයුතු කිරීමට සිදුවේ. මේනිසා මෙම කාර්යයන දිරිගැන්වීමට එක් එක කාර්යයන් භාර නිලධාරීන් වෙත දිරි දීමනාවක් ගෙවීමට කටයුතු කරනු ලැබේ. ඒ පිළිබඳ උපදෙස් පසුව ඔබ වෙත නිකුත කරමි.

8. <u>දීමනාපත්‍ර ලබා දෙන ඉඩම් මැනීම.</u>

බෙදා දී ඇති ඉඩම් මැන පිඹුරුපත් ලබාගැනීමට කල්වේලා ඇතිව අවශ්‍ය මැනුම් නියෝග නිකුත් කල යුතුය. මෙහිදී බෙදා දී ඇති එක ජනාවාස ඉඩමක් සඳහා මැනුම් නියෝග දෙකක් නිකුත් කල යුතුවේ. පළමු මැනුම් නියෝගය ආ.එ.අ.8 ආකෘතියෙන ඉඩම් මැන මූලික පිඹුරක් සෑදීමට වන අතර, දෙවන මැනුම් නියෝගය ආ.එ.අ.118 ආකෘතියන 'O' රේඛා චිත්‍ර ලබා ගැනීම සඳහා යැවිය යුතුය. ආ.එ.අ.8 හා ආ.එ.අ.118 මැනුම් නියෝග සමග තෝරාගත් කට්ටිකරුවන්ගේ නාමලේඛනයක් අමුණා යැවීමට ක්‍රියාකරන්න. එකට යාබදව ඇති ඉඩමක, ඉඩම් කැබලි සඳහා මූලික පිඹුර සකස් කිරීමට ඉල්ලුම් කරන විට හා එම ඉඩම් ලාභීන්ගේ නාම ලේඛනය සමග එක්



CamScanner

ආ.එ.අ.8 ආකෘතිය යැවීම ප්‍රමාණවත්ය. 'O' රේඛා චිත්‍ර සඳහාද වෙන වෙනම මැනුම් නියෝග යැවීම වෙනුවට එක් ආ.එ.අ.118 ආකෘතියක එක මූලික පිඹුරක සියලුම රේඛා චිත්‍ර ඉල්ලීමට ක්‍රියා කිරීම පහසු වන අතර, ඊට ගැලපෙන පරිදි ආ.එ.අ.8 හා ආ.එ.අ.118 ආකෘති සම්පූර්ණ කිරීම අවශ්‍යය.

කරුණාකර මේ අනුව ඔබගේ කොට්ඨාශයේ සුනාමියෙන් අවතැන්වූ, රජයේ ඉඩම් වල පදිංචි කළ ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම සඳහා නොපමාව පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධව ඔබගේ අදහස් සහ වෙනත් යෝජනා ඇත්නම් ඒවා මා වෙත නොපමාව යොමු කරන්නේ නම් මැනවි. මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන ලැබෙන සහය ඉතා අගය කරමි.

එස්.බී.ඒ.බී. බොරලැස්ස
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. ගරු කෘෂිකර්ම සංවර්ධන හා ඉඩම් ව්‍යවහාර අමාත්‍යතුමා - කා.දැ.ගැ.ස.
2. ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.ස.
3. අග්‍රාමාත්‍ය ලේකම් - කා.දැ.ගැ.ස.
4. ලේකම්, කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය - දැ.ගැ.ස.
5. ලේකම්, නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය - දැ.ගැ.ස.
6. මැනුම්පති, මැනුම් දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
7. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
8. සුනාමි විපත් ප්‍රදේශවල සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්;
   අදාල කටයුතු සම්බන්ධීකරණය කර ප්‍රාදේශීය ලේකම්වරුන් ගෙන ලැබෙන ඉ.කො./සු.දි.ප/1 හා ඉ.කො./සු.දි.ප/2 ලයිස්තු නිර්දේශ කිරීම සඳහා.
9. සුනාමි විපත් ප්‍රදේශවල සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු
   අදාල කටයුතු සම්බන්ධීකරණය කර ප්‍රාදේශීය ලේකම්වරුන් ගෙන ලැබෙන ඉ.කො./සු.දි.ප/1 හා ඉ.කො./සු.දි.ප/2 ලයිස්තු නිර්දේශ කිරීම සඳහා.
10. ප්‍රධාන විධායක නිලධාරී, සුනාමි ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ආයතනය - දැ.ගැ.ස.
11. සාමාන්‍යාධිකාරී, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - දැ.ගැ.ස.
12. සාමාන්‍යාධිකාරී, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - දැ.ගැ.ස.



CS CamScanner